5

චක්‍රලේඛ අංක එම19/13/2006

(14/2006)

මගේ අංකය : එම 19/විවිධ/04
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
280, කෙළින් වීදිය
කොළඹ 11.
2006 දෙසැම්බර් 28 දින

සියලුම දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්
විවාහ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## 2006 අංක 36 දරණ (සාමාන්‍ය) විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත - විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ගාස්තු සංශෝධනය කිරීම.

2006 අංක 36 දරණ විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ පිටපතක් මේ සමග එවමි.

02. මෙකී සංශෝධන පනතින්, 1997 අංක 12 දරණ (සංශෝධන) පනතින් සංශෝධනය කළ (112 අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන උප ලේඛනය යටතේ සඳහන් විවාහ ලියාපදිංචි කිරීමට අදාල ගාස්තු පහත පරිදි නැවත සංශෝධනය කර ඇත.

දෙවන උපලේඛනය (62 වගන්තිය)

| කාර්යය | ගෙවිය යුත්තේ කාටද | ගෙවනු ලබන්නේ කවුරුන් විසින්ද යන වග | මුදල | මුදල ගෙවන ආකාරය |
|---|---|---|---|---|
| 1. ඔහුගේ කාර්යාලයේදී විවාහ දැන්වීමක් ඇතුළත් කිරීම | රෙජිස්ට්‍රාර් | අයදුම්කරු | රු. 50.00 | මුදලින් ගෙවිය යුතුය |
| 2. වෙනත් ඕනෑම ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුල් කිරීම | රෙජිස්ට්‍රාර් | අයදුම්කරු | රු.100.00 | -එම- |
| 3. ඔහුගේ කාර්යාලය හැර වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුලත් කිරීම | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | අයදුම්කරු | රු. 100.00 | මුද්දර මගින් |
| 4. ඔහුගේ කාර්යාලය හැර වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුලත් කිරීම | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | අයදුම්කරු | රු. 150.00 | -එම- |
| 5. ඔහුගේ කාර්යාලයේදී විවාහය සිදු කිරීම. | රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශවයන් | රු. 250.00 | මුදලින් ගෙවිය යුතුය |
| 6. ඔහුගේ කාර්යාලයේදී විවාහය සිදු කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශවයන් | රු. 100.00 | මුද්දර මගින් |
| 7. ඔහුගේ කාර්යාලයේදී විවාහය සිදු කිරීම. | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශවයන් | රු. 100.00 | -එම- |